**ශීර්ෂය 103 - ආරක්ෂක අමාත්‍යාංශය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්වාගණනය කළ මතය**

ආරක්ෂක අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 11 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 21 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ  කෙරෙහි බලපෑමක් වියහැකි බවට අපේක්සා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ  අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි.  වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති සහ හෙළිදරව් කිරීම් ඇතුලත්  මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම්  අගයන ලදි.

මාගේ විගණනය තුලදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී අක්මුදල් ගැලපීම් ගිණුමට අදාල ගැලපීම් සිදුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී අදාල ගැලපීම් සිදුකර සංශෝධිත අගයන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අනුරූපී අගයන් ලෙස දක්වා තිබුණි. එම නිසා ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයට අනුරූපී යැයි ප්‍රකාශ කල නොහැකිය.

(ආ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් සිදුකල නිර්දේශ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇති දේපල පිරියත හා උපකරණ වටිනාකමින් රු.මිලියන 16,955 ක් 2019 ගිණුම්වලට ආරම්භක ශේෂයන් ලෙස ගැනීමේදී අත්හැරී තිබුණි. | සමාලෝචිත වර්ෂයේ අවසානයට පවතින දේපල පිරියත හා උපකරණවල වටිනාකම නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. | දේපල පිරියත හා උපකරණවල ආරම්භක ශේෂයේ අගය දැක්වීමේදී ගිණුම්කරණමය දෝෂයන් නිසා අත්හැරීම් සිදු වී තිබු අතර, ඒවා හඳුනාගෙන වත්කම් යටතේ ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |
| (ආ) | දේපල පිරියත හා උපකරණ වල 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අවසාන ශේෂය රු.මිලියන 6,076.73 ක් වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ආරම්භක ශේෂය රු.මිලියන 8,812.79 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.මිලියන 2,736.06 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වත්කම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේද උපදෙස් හා මඟපෙන්වීම අනුව මූල්‍ය නොවන වත්කම් සීගාස් මෘදුකාංගයට ඇතුලත් කිරීමට හා දෝෂයන් නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. | නිළධාරීන් හඳුනාගෙන ඇපතැබීම සඳහා ක්‍රමවේදයක් සකස්කරමින් පවතී . |

### 1.6.3 ප්‍රධාන ගනන්දීමේ නිලධාරී විසින් සිදුකල යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුල සියළුම විගණන විමසුම් වලට පිලිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගනන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත් වාර්තාවේ 3.7 ඡේදය ප්‍රකාරව විගණන විමසුම් වලට පිලිතුරු ලබාදීම ප්‍රමාද වී තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | අදහස් දක්වා නොමැත. |

## 1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| අනුකූල නොවීම් | | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 1916 අංක 33 දරණ තුවක්කු අඥාපනත සිට 1996 අංක 22 දරන තුවක්කු පනත දක්වා වූ සංශෝධන 10 ක් ඇතුලත් 182 අධිකාරය 51, 05(1), 23(3), 22(2)(උ) වගන්ති | ජීවිත හා දේපල ආරක්ෂාව සදහා සහ කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා දිස්ත්‍රික්ක 04 ක නිකුත්කල බෝර 12 හා 16 ගිනි අවි 2288 ක් සම්බන්ධව පනත ප්‍රකාරව දීර්ඝ කාලයක සිට බලපත්‍ර අළුත් නොකිරීම් අවස්ථා නිරීක්ෂණය විය. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | බලපත්‍ර අලුත් නොකිරීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන් සහ දිස්ත්‍රික්කයේ පොලිස් අධිකාරීවරුන් දැනුවත් කිරීමටත් අදාළ නීතිමය කටයුතු සිදු කරන ලෙසත් දන්වා යැවීමට කටයුතු කෙරේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 136,137,138 සහ රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018.12.18 දිනැති අංක PFD/DEF/103/GN/2018 (2) දරණ ලිපිය | ත්‍රිවිධ හමුදාව අත්පත් කරගත් වාහන විධිමත් පරිදි පවරා ගැනීම සඳහා සිදුකල සමීක්ෂණයකට අදාලව සමීක්ෂණ කටයුතුවල නිරතවූ නිලධාරීන් සඳහා අනුමත සීමාව ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 3.08 ක් ගෙවා තිබුණි. | භාණ්ඩාගාරය විසින් ලබාදුන් අනුමත සීමාව තුල ගෙවීම් කටයුතු සිදු කල යුතුය. | ඒ පිළිබඳව සොයාබලා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා මණ්ඩලයක් පත් කර ඇති අතර, අදාළ මණ්ඩල වාර්තාව ලැබුණු පසු අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 756 හා 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2019 වර්ෂයට අදාල අංශ 65 කින් සමන්විත ආරක්ෂක අමාත්‍යාංශයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2020 අගෝස්තු 31 දින දක්වාත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | සමීක්ෂණ මණ්ඩල පත්කර ඇති අතර වසංගත තත්ත්වය හේතුවෙන් සමීක්ෂණ කටයුතු ප්‍රමාදවිය. |
| (ඈ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 5 සහ 6.1 ඡේදය | මානව සම්පත් සැලැස්ම තුලින් කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණුව ලබාදීමේ අවශ්‍යතාවය ඉටුවී නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | මානව සංවර්ධන සැලසුම් සකස් කිරීමට ඉදිරියේ සැලසුම් කර ඇත. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **ආදායම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආදායම් සංකේත අංක 10.03.07.05 යටතේ - රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂයේ බලපත්‍ර ගාස්තු අදායම් ඇස්තමේන්තුව රු.මිලියන 11.4 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව එය සියයට 50 ක් අඩුවෙන් ඇස්තමේන්තු කර තිබුණි. වර්ෂය තුල රැස්කල අදායම රු.මිලියන 22.77 ක් විය. | ආදායම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙලකල යුතුය. | ලද ආදායම් සැලකිල්ලට ගෙන 2019 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුවක් රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත යොමුකල බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 1.128 ක හිඟ බලපත්‍ර ගාස්තු ආදායම් විය. ඉන් රු.මිලියන 0.304 ක් වසර දෙකකට වැඩි කාලයක් හිඟව පැවතුණි. | 2017 දෙසැම්බර් 21 දිනැති 261/2017 දරණ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනිමට කටයුතු කල යුතුය. | හිඟ ආදායම් අයකර ගැනිමේ ප්‍රගතිය පිළිබඳව අධීක්ෂණය කිරීමට සියළුම නිලධාරීන් දැනුවත් කිරීම සහ බලපත්‍ර අළුත් කරන අවස්ථාවේදී හිඟ මුදල් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කෙරේ. |
| (ඇ) | රාජ්‍ය මුදල් අධ්‍යක්ෂක ජනරාල්ගේ 2015 දෙසැම්බර් 11 දිනැති අංක පීඊඩී/04/08/01/59 දරණ චක්‍රලේඛය අනුව ගාස්තු කාලානුරූපීව සංශෝධනය කල යුතු වුවද 1996 අංක 22 දරණ තුවක්කු (සංශෝධන) පනතේ තුවක්කු බලපත්‍ර ගාස්තු දීර්ඝ කාලයක සිට සංශෝධනය වී නොතිබුණි. | 1996 අංක 22 දරණ තුවක්කු පනත සංශෝධනය කරගත යුතුය. | රෙගුලාසි පැනවීම ඇමතිතුමාට බලය පැවරෙන ආකාරයෙන් ගිනි අවි පනත සංශෝධනය කිරීම සඳහාද නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. |
| (ඈ) | ආදායම් සංකේත 20.03.06.00 යටතේ සමාලෝචිත වර්ෂයේ සාමසාධක මෙහෙයුම්වලින් ඇස්තමේන්තුගත අදායම රු.මිලියන 3,850 ක් වුවද රැස්කල අදායම රු.මිලියන 1,681.41ක් හෙවත් සියයට 43.67 ක ප්‍රතිශතයකි. | ඇස්තමේන්තු සකස්කිරීමේදී තාත්වික ගණනය කිරීම් කල යුතුය. | ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. ඒ සම්බන්ධ පසුවිපරම් කරීමට කටයුතු කෙරේ. |
| (ඉ) | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ලෙබනන් සහ සුඩාන් රාජ්‍යන්හිද, ශ්‍රී ලංකා ගුවන් හමුදාව මධ්‍යම අප්‍රිකාවේ සහ දකුණු සුඩානයේද සාමසාධක මෙහෙයුම් රාජකාරී වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.මිලියන 2404.35 ක හිඟ ආදායමක් විය. ඉන් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මධ්‍යම අප්‍රිකාවේ මෙහෙයුම් රාජකාරී වෙනුවෙන් අයවිය යුතු රු.මිලියන 1563.19 ක් වූ අතර ඉන් රු.මිලියන 280.07 ක් හා රු.මිලියන 585.60 ක් පිළිවෙලින් 2017 හා 2018 වර්ෂ සඳහා විය. | මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව හිග ආදායම් වාර්තා නිසි පරිදි ඉදිපත්කිරීමටත් හිග ආදායම් නිසි පරිදි අයකරගැනීමටත් කටයුතු කිරීම හා ඒ සම්බන්ධ පසුවිපරම් කටයුතු අඛණ්ඩව කල යුතුය. | අදාළ ආයතන දැනුවත් කරමින් සහ මනා සම්බන්ධීකරණයෙන් යුතුව හිඟ ආදායම් තව දුරටත් එකතු විම වැලැක්විම සඳහා පසුවිපරම් කටයුතු කෙරේ. |

| | | |
|---|---|---|
| (ඊ) විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාව ,එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් ආදායම් සහ අමාත්‍යාංශයේ බලපත්‍ර ගාස්තු ආදායම් ඇතුළු ආදායම් ශීර්ෂය 05 ක අදායම් එකතු කිරීමේ ක්‍රියාකාරි සැලැසුම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා නොතිබුණි. අනාවරණය කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 ප්‍රකාරව කටයුතු කල යුතුය. | 2020 වර්ෂයේ සිට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට ඉදිරියේදී කටයුතු කෙරේ. |
| (උ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මාලි රාජ්‍ය තුල සාමසාධක මෙහෙයුම් රාජකාරි වෙනුවෙන් ලද ඇමරිකානු ඩොලර් 6,604,752 ක් හෙවත් රු.මිලියන 1,197.96 ක ආදායම් වාර්ෂික ඇස්තමේන්තු හා මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි. | වාර්ෂික ඇස්තමේන්තුවල ඇතුලත්කර හිග ආදායම් කඩිනමින් අයකරගැනීමට කටයුතු කල යුතුය. | මාලි රාජ්‍යයේ එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් රාජකාරී වෙනුවෙන් ලැබීමට නියමිත ආදායම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙන් පසුව ඇස්තමේන්තු කර ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙතින් අමාත්‍යාංශය වෙත ලබා දීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කිරීමට නොහැකිව ඇත. |

**2.2 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට මූලධන වැය විෂයයන් 47 කට අදාලව එකතුව රු.මිලියන 1,081.89 ක සහ පුනරාවර්තන වැය විෂයයන් 79 කට අදාලව එකතුව රු.මිලියන 434.09 ක ඉතිරි වීම් පැවැතිණි. එම ඉතිරිවීම් වෙන්කරන ලද ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ත් සියයට 99 ක් අතර පරාසයක විය. | මුදල් රෙගුලාසි 50 (11) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්, නිවැරදිවත් පිලියෙල කලයුතු අතර වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුය. | ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම, අමාත්‍ය කාර්යාලයේ වියදම් දැරීමට සිදු නොවීම සහ වසර මැද ප්‍රාග්ධන වියදම්, පුනරාවර්ථන වියදම් සීමා කරන ලෙස දැනුම් දීම මත ප්‍රතිපාදන ඉතිරිවිය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුනරාවර්ථන වැය විෂයන් හතරක හා මූලධන වැය විෂයන් දහයක පිළිවෙලින් එකතුව රු.මිලියන 1.65 ක හා රු.මිලියන 23.65 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. තවද වැය විෂයක රු.මිලියන 36 ක පරිපූරක ප්‍රතිපාදනද සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. | අවශ්‍යතා නිසිලෙස හදුනාගෙන ඇස්තමේන්තු සකස් කලයුතු අතර ලබාදී තිබූ ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කල යුතුය, වියදම් පැන නැගේවියැයි අපේක්ෂාවෙන් ප්‍රතිපාදන ඉල්ලුම් නොකල යුතුය. | ආරක්ෂක අමාත්‍ය, රාජ්‍ය අමාත්‍ය කාර්යාල වල අපේක්ෂිත වියදම් පැන නොනැගීම හා මාධ්‍ය මධ්‍යස්ථානය අහෝසිවීම, වාහන මිලදී ගැනීම තාවකාලිකව අත්හිටු වීම නිසා ප්‍රතිපාදන ඉතිරිවිය. |
| (ඇ) | අත්‍යවශ්‍ය බව හා ප්‍රතිපාදන ප්‍රමාණවත්ව නොපැවැතීම යනාදී කරුණු දක්වමින් මුදල් රෙගුලාසි 66 යටතේ ඉල්ලුම්පත් 23 ක් මගින් ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණු නමුත් ඉන් එකතුව රු.මිලියන 39.41 ක් සමාලෝචිත වර්ෂය තුල උපයෝජනය කරගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 66 පරිදි මාරුකල ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කල යුතුය. | අවශ්‍යතාවය මත පමණක් අදාළ ප්‍රතිපාදන මාරු කිරීම් සිදු කර ඇත. |
| (ඇ) | විදේශීය සම්මන්ත්‍රණයකට නිලධාරියාගේ සහභාගිත්වය දැනුම්දීමේ ප්‍රමාදය මත ආරාධිත රටෙන් වියදම් නොදැරීම නිසා නිලධාරියාට විදේශ ගමන සදහා රු. 979,365 ක් අමාත්‍යාංශය විසින් දැරීමට සිදුවී තිබුණි. | චක්‍රලේඛ සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | අදාල ආයතනය වෙත නියෝජනය දැනුම් දීමේදි ප්‍රමාදයක් ඇතිවිය.ඒ අනුව ප්‍රතිපාදන අමාත්‍යාංශයෙන් දරා ඇත. |

**2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශයේ සේවයේ නිරතව සිට ස්ථාන මාරුවී ගිය,මියගිය,විශ්‍රාම ගිය,වැඩ තහනම් කල හා සේවය හැරගිය නිලධාරීන් සහ වෙනත් නිලධාරීන් 150 දෙනකුගෙන් රු.මිලියන 8.87 ක ණය ශේෂයක් අයවිය යුතුව තිබුණි. ඉන් වර්ෂ 05 කට වැඩි ණය ශේෂය රු.මිලියන 3.23 ක් විය. | 2019 ජූනි 27 දිනති අංක 5/2019 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. | ණය අයකර ගැනීමට අවශ්‍ය සියළු ක්‍රියාපටිපාටින් සිදුකර ඇත යම් ප්‍රතිශතයක් කපා හැරීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවටද යොමු කර ඇත. |

**2.4 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට තැම්පත් ගිණුම් 04 ක වර්ෂ දෙක ඉක්මවූ රු.මිලියන 169.9 ක ශේෂයක් විය. එමෙන්ම මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු නොකල තැම්පත් ගිණුම් 02 ක ශේෂයන්හි එකතුව රු.මිලියන 0.49 ක් විය. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කල යුතුය. | වසර දෙක ඉක්මවූ රඳවා ගැනිම් හා අනෙකුත් තැම්පතු පිළිබඳව මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කරමින් පවතී. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ආරක්ෂක අමාත්‍යාංශයේ කාර්ය හා කර්තව්‍ය යටතේ පුපුරණ ද්‍රව්‍ය හා ගිනි අවි සම්බන්ධව ජනාධිපති ලේකම්ගේ සභාපතිත්වයෙන් යුතු එම විෂයට | පුපුරණ ද්‍රව්‍ය අවභාවිතා කිරීමේ ඉඩකඩ අවුරාලන පරිදි අවශ්‍ය නෛතික ප්‍රතිපාදන ප්‍රමාණවත් පරිදි | චක්‍රලේඛය ක්‍රියාත්මක කිරිම තාවකාලිකව අත්හිටුවීමට තීරණය කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධිත අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතනවල නිළධාරීන්ගේ සහභාගිත්වයෙන් නිර්දේශිත පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් හඳුන්වාදී තිබුණු චක්‍රලේඛය මේ දක්වාත් ක්‍රියාත්මකවී නොතිබුණි. | සැලැසීම, යෝග්‍ය පාලන ක්‍රම ස්ථාපිත කර අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම, මනා සුපරීක්ෂණය හා අධීක්ෂණය කිරීම ආදී කටයුතු කල යුතුය. | |
| (ආ) | ත්‍රිවිධ හමුදාව හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් බාහිර පාර්ශවයන් වෙත සේවා සැපයීමෙන් උපයනු ලබන ආදායම් ඒකාබද්ධ අරමුදලට බැරකලයුතු අනුපාතය සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කලයුතු වුවද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාත් ඒ සඳහා කුමවේදය සකස් කර ගෙන නොතිබුණි. | 2016 ඔක්තොබර් මස 26 පැවැති විගණන හා කලමණාකරණ රැස්වීමේදී එලැබි තීරණයන්ට අනුව කටයුතු කරන බවට සහතික විය යුතුය. | අදහස් දක්වා නොමත. |
| (ඇ) | අංක අමප/16/10738/703/033 දරණ 2016 මැයි 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විශේෂ කාර්ය බලකායේ සංග්‍රාමික බල ඇණියක් මාලි රාජ්‍ය තුල ස්ථාපිත කිරීම සඳහා සහ ඒ සඳහා අවශ්‍ය මිලදී ගැනීම සඳහාද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී නිලධාරීන් 320 දෙනෙකු තෝරාගෙන 2016 වර්ෂයේදී හා 2019 වර්ෂයේදී පුහුණුව ලබාදී තිබුනද විශේෂ කාර්යය බලකාය එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරී සඳහා එක්වීම තවදුරටත් ප්‍රමාදවී තිබුණි. තවද 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට රු.මිලියන 880.73 ක් දරා තිබුණද එම උපකරණ නිෂ්ක්‍රියව ගබඩා කර තිබෙන බව විගණනයට වාර්තා විය. | එක්සක් ජාතීන්ගේ සාම සාධක රාජකාරී සඳහා විශේෂ කාර්ය බලකාය සම්බන්ධ වීමට ඇතිකරගත් මූලික එකඟතා පරිදි කටයුතුකර එම අරමුණු ඉටුකිරීමට කඩිනමින් කටයුතු කල යුතුය. | ප්‍රසම්පාදන කටයුතු සඳහා අදාල අනුමැතිය ලැබීමේ ප්‍රමාද, ප්‍රතිපාදන නොලැබීම හා ප්‍රසම්පාදන කටයුතුවල පැවැති ප්‍රමාදයන් බලපා ඇත. |

| | | |
|---|---|---|
| (ඇ) අංක අමප/16/0498/7003/017 හා 2016 මාර්තු 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජාතික ආරක්ෂාව පිළිබඳ රජය දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය ස්ථාපනය කිරීමට අනුමැතිය ලබාදී එහි කටයුතු පවත්වාගෙන යමින් තිබුනද එම ආයතනයට අදාල පනතක් 2019 වර්ෂයේ අවසානය දක්වාත් අනුමතවී නොතිබුණි. | ආයතනය පිහිටුවීමට අදාල පනත අනුමත කර ගැනීම හා ලැබී ඇති අනුමැතීන් ප්‍රකාරව ස්ථිර කාර්යමණ්ඩල බඳවාගැනීම කල යුතුය. | පනත නීති කෙටුම්පත් දෙපාර්තුමේන්තුව වෙත යොමුකර ඇත. නැවත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමින්සිටී. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උපාය මාර්ගීක ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (අ) මූලික අධ්‍යනයන් සිදුකර අදාල අනුමැතීන් ලැබී රු.මිලියන 5.47 ක ඉදිකිරීම් කිරීමෙන් පසු ස්ථානීය ගැටළු හේතුවෙන් කුලුණු 03 ක ස්ථාන වෙනස්කර තිබුණි. | පූර්ව ප්‍රසම්පාදන කටයුතු යටතේ ඉදිකිරීම සඳහා යෝජිත වැඩබිම් පිළිබද නිසි අධ්‍යනයක් කල යුතුය. ව්‍යාපෘතියේ ඉදිකිරීම්වල අනාර්ථික පිරිවැය හදුනාගැනීම, අවමකිරීම සහ වාර්තාකිරීම කල යුතුය. | නිරීක්ෂණ සමඟ එකඟ වේ. යාපනය සහ කුරුණෑගල ස්ථානවල ඇති වූ ගැටළු නිරාකරණය කිරීම ව්‍යර්ථ විය. පානම නාවුක කඳවුරේ කුළුණක් ඉදිකිරීම නිසා එම ස්ථානය වෙනස් කිරීමට හේතුවිය. |
| (ආ) රු.මිලියන 35 කට මිලදී ගෙන තිබුණු විදුලි ජනක යන්ත්‍ර 22 ක් 2017 වර්ෂයේ සිට නිෂ්ක්‍රියව පැවතුණි. | කුලුණු ස්ථාන වල විදුලි ජනක යන්ත්‍ර කුටි ඉදිකර යන්ත්‍ර ස්තාපිතකර යෝජිත අරමුණු සඳහා යොදා ගැනිම කඩිනම් කලයුතුය. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. අදාළ ජෙනරේටර් යන්ත්‍ර නිසි ලෙස ආවරණය කිරීමට කටයුතු කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන උපයෝජනය සියයට 45 ක් විය.එය 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සියයට 3 සිට සියයට 17 අතර පහල පාරාසයක පැවතුණි. | වාර්ෂික අයවැය ප්‍රතිපාදන උපරිම ලෙස ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් උපයෝජනය කලයුතු අතර ව්‍යාපෘතියට අදාලව මනා සුපරීක්ෂණයක් හා අධීක්ෂණයක් ක්‍රියාත්මක කල යුතුය. | නිරීක්ෂණ සමඟ එකඟ වේ. |
| (ඇ) | සංනිවේදන කුලුණු සඳහා අදාල ආයතන වල අනුමැතිය ලැබීම වසර 02 ක් දක්වා ප්‍රමාද වී තිබීම හේතුවෙන් කුලුණු ඉදිකිරීම් කොන්ත්‍රාත් ප්‍රධානය 2018 වර්ෂයේ අවසානය දක්වා ප්‍රමාදවී තිබුණි. ඒ අනුව ඉදිකිරීම් නිමකිරීමට සමාලෝචිත වර්ෂයේදීත් නොහැකිවී තිබීම සහ 2016 වර්ෂයෙ සිට මිලදී ගැනීමට සැලැසුම්කල ක්ෂුද්‍ර තරංග පද්ධති ප්‍රසම්පාදනය අවස්තා දෙකකදී ලංසු කැඳවා ඇගයීම් අධියරේදී අවලංගුකර තිබීම හා එම ඇස්තමේන්තුවල කාලීන භාවය,පිරිවිතරවල යෝග්‍යතාවය, ලංසුකරුවන්ගේ නොඑකගතා මත ප්‍රසම්පාදනය අවිනිශ්චිත මට්ටමක පැවැතිණි. මේ අනුව ත්‍රිවිධ හමුදාව ඇතුළු පොලිස් සේවාවන්හි සන්නිවේදන අවශ්‍යතා සඳහා වූ දත්ත මූල ආධාරත උපාය මාර්ගීක ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ආරම්භකර 2016 වර්ෂයේ නිමකල යුතු වුවද අතිරේක වර්ෂ 04 ක කාලයක් ලබාගෙන තිබියදීත් නිම නොවීම හේතුවෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුවීම තවදුරටත් ප්‍රමාදවෙමින් පැවැතිණි. | සමස්ත ව්‍යාපෘති සැලැස්ම යාවත්කාලීන කිරීම හා ඉදිරි වර්ෂ සඳහා ප්‍රතිපාදන අවශ්‍යතා දැක්වෙන මූල්‍ය සැලැස්මක් පිළියෙල කර නියමිත කාලසීමාව තුල ව්‍යාපෘතිය නිම කර අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමට කටයුතු කිරීම. | නිරීක්ෂණ සමඟ එකඟ වේ. අදාළ ක්‍රියා මාර්ග ඉටු කිරීමේදී ඒ ඒ අංශ තුළ සහ කාර්මික ඇගයීම් කමිටුවේ සිදු වුන ප්‍රමාදයන් වේ. ප්‍රමාදය සලකා බලා ව්‍යාපෘති කාලසීමාව අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2020 දෙසැම්බර් තෙක් දීර්ඝ කරන ලදී. |

## 3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2002 සැප්තැම්බර් 12 දින අංක 402 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යංශයේ 2019 වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවද එය ඉටුවී නොතිබුණි. | 2002 සැප්තැම්බර් 12 දින අංක 402 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. | වාර්තාව 2020 සැප්තැම්බර් 16 දින සභාගතකිරීමට කටයුතුකර ඇත. |

## 3.4 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) <u>ත්‍රිවිධ හමුදා මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතිය</u> | | |
| 2014 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂා කර තිබුණු නමුත් ත්‍රිවිධ හමුදා මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු වල 2019 දෙසැම්බර් 31 දිනට සමස්ථ ප්‍රගතිය සියයට 56.4 විය. එහි අදියර 1 යටතේ වූ ආරක්ෂක අමාත්‍යංශය, නාවික හා ගුවන් හමුදා මූලස්ථාන ගොඩනැගිලි වල ප්‍රගතිය සියයට 50 ක මට්ටමේ හා ශ්‍රවනාගාරයේ ඉදිකිරීම් සියයට 8 ක පහල මට්ටමක පැවතුණි. | ව්‍යාපෘති කලමනාකරණ ඒකකය හා ඉදිකිරීම් කලමනාකරණ ඒකකය ව්‍යාපාතියේ අපේක්ෂිත ඉලක්කයන් ලගාකරගත යුතුය. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රමුඛතා අදියර 10 ක් යටතේ කොන්ත්‍රාත් 192 කට රු.මිලියන 12,291 ක මූල්‍ය අවශ්‍යතා දක්වමින් ප්‍රසම්පාදන සැලැසුම් සකසා තිබුණද අයවැය ඇස්තමේන්තු රු.මිලියන 4,070 කට සීමාවී වර්ෂය තුල රු.මිලියන 3,990 ක වියදමක් දරා තිබුණි. | ව්‍යාපෘති කලමනාකරණ ඒකකය හා ඉදිකිරීම් කලමනාකරණ ඒකකය ව්‍යාපාතියේ අපේක්ෂිත ඉලක්කයන් ලගාකරගත යුතුය. | අදහස් දක්වා නොමත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රතිපාදන නොමැතිවීම, අවලංගු කිරීම, තාවකාලිකව අත්හැරදැමීම හේතුවෙන් ප්‍රසම්පාදන කාර්යන් 19 ක් ක්‍රියාත්මක වී නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ ප්‍රසම්පාදන සැලැසුම් ප්‍රකාරව අදාල කාර්යන් ක්‍රියාත්මක කිරීමට කටයුතුකල යුතුය. | අදහස් දක්වා නොමත. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකු විසින් රු. මිලියන 674.25 ක කාලය දීර්ඝ කිරිමේ හිමිකම් පෑම් 17 ක් ඉල්ලුම් කර තිබුණු අතර ඉන් එක් කොන්ත්‍රාත් කරුවෙකුට රු. මිලියන 5.18 ක් ගෙවා තිබුණි. | කොන්ත්‍රාත් සුපරීක්ෂණය සහ අධීක්ෂණය නිසි ලෙස ක්‍රියාත්මක කරමින් අතිරේක හිමිකම් පෑම් අවමකරගැනීමට කටයුතු කල යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ඉ) | 2014 වර්ෂයේ නිමකල යුතු ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂයේ අවසානයට මුළු වත්කම් වටිනාකම රු.මිලියන 25,645 ක් විය. ඉන් රු.මිලියන 23,711 ක නොනිමි වැඩ වටිනාකමක් නියෝජනය විය. යුද්ධ හමුදා මූලස්ථානය හැර අනෙකුත් කාර්යාල මේ දක්වාත් මූලස්ථාන සංකීර්ණය තුල ස්ථාපිත කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලසුම් ප්‍රකාරව කටයුතු නිමකර යෝජිත කාර්යාල ස්ථාපිත කිරීම කල යුතුය. | අදහස් දක්වා නොමැත. |

## 3.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට හා මුදල් රෙගුලාසි 880 අනුකූලව ඇප තැබිය යුතු වුවද අමාත්‍යාංශයේ නිලධාරීන් සමාලෝචිත වර්ෂයේදීද ඇප තබා නොතිබුණි. | 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට හා මුදල් රෙගුලාසි 880 අනුකූලව ඇප තැබිය යුතුය. | අදහස් දක්වා නොමැත. |

## 3.6 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) යුධ සමයේ ත්‍රස්තවාදීන් සතුවු ආරක්ෂක හමුදාවන් විසින් අත්පත් කර ගත් වාහන1880 ක් පිළිබද සමීක්ෂණයක් කර තිබුනද පසුබිම් වාර්තා සකස්කර නොතිබීම,වාර්තාවේ අඩුපාඩු පැවැතීම, අපහරණ හා පවරාගැනීම් සඳහා අමාත්‍යාංශය වෙත බලය පැවැරීම තහවුරු නොවීම ආදී ගැටලුකාරී තත්ත්වයේ පැවතිනී. | වත්කම්වල අයිතිය පවරා ගැනීම හා අපහරණ කටයුතු සඳහා පසුබිම් වාර්තාවක් සකස්කර විධිමත් අනුමැතියක් ලබාගත යුතුය. | පසුබිම් වාර්තාවක් සකස්කර නොමැත. සමීක්ෂණ වාර්තාවේ මුද්‍රණ දෝෂ සිදුවීම නැවැත පරීක්ෂාකිරීමට යොමුකර ඇති අතර මුල් සමීක්ෂණයේ අපහරණයට නිර්දේශිත වාහන 70 න් 57 ක් පසුව ධාවනයට යොදාගෙන ඇත. |
| (ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ කාර්යාල සඳහා කොල්ලුපිටියේ පිහිටි ගොඩනැගිල්ලක් 2019 ජනවාරි සිට වසරක කාලයකට බදු පදනම මත වාර්ෂිකව රු.මිලියන 40 කට කුලියට ගෙන තිබුණි. මේ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |

| | | | |
|---|---|---|---|
| **(i)** | කාර්යාලයක අවශ්‍යතාවය කලින් හඳුනාගෙන තිබියදී මුද්‍රිත මාධ්‍ය මගින් දැන්වීම් පල නොකර හා මුද්‍රාතැබූ මිලගණන් ලබාගැනීමකින් තොරව ඉදිරිපත් කල ලංසු තුනක් අතුරින් අවම මිලගණන් ඉදිරිපත්කර ඇති ලංසුව තෝරා ගැනීම හේතුවෙන් හඳුනාගත් ඉංජිනේරු සේවාවන් ආවර්ණය කරගෙන ලබාගත හැකිව තිබූ රු.මිලියන **13** ක මූල්‍ය වාසිය අමාත්‍යංශයට අහිමිවී තිබුණි. | පිරිවැය සැලැකිල්ලට ගෙන මුද්‍රිත මාධ්‍ය මගින් දැන්වීම් පලකර රජයට උපරිම ආර්ථික වාසිය ලැබෙන පරිදි තීරණ ගත යුතුය. | මෙම ගොඩනැගිල්ල භාවිතයට සුදුසු තත්වයට ගැනීමට අමතර ඉංජිනේරු සේවාවන් සඳහා ආසන්න වශයෙන් රු.මිලියන 12 ක පිරිවැයක් දැරීමට සිදුවන අතර ඒ සඳහා අවම වශයෙන් මාස 03 කට ආසන්න කාලයක් ගතවන බව නිරීක්ෂණය කර ඇත. |
| **(ii)** | තවද ගොඩනැගිල්ල යෝග්‍ය බවට නිර්දේශකර තිබුනද ගොඩනැගිල්ලේ පාදමේ කොන්ක්‍රීට් කණු **03** ක් සහ කොන්ක්‍රීට් පඩිපෙළ පිපිරීම් වලට ලක්ව ඇඩි අනාරක්ෂිත තත්වයක පැවැතිණි. | ගොඩනැගිලි කුලියට ගැනීමේදී තාක්ෂණික කරුණුමත යෝග්‍යතාවය පරීක්ෂාකර වාර්ථාවක් ලබාගතයුතුය. | අදහස් දක්වා නොමැත. |

**3.7 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

-----------------------------------------------

| විගණන විමසුම් පිළිබඳ විස්තරය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යංශය වෙත යොමුකල විගණන විමසුම් 07 කට පිළිතුරු සැපැයීමේදී මාස 01 සිට මාස 03 ක කාල ප්‍රමාදවී තිබුණි. | නිශ්චිත කාලසීමාවන් තුල සියළුම විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගනන්දීමේ නිලධාරී සහතික විය යුතුය. | අදහස් දක්වා නොමැත. |

**4. තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසාර සංවර්ධන ඉලක්කයන්හි ළගාවීම මැන බැලීම සඳහා දත්ත පද්ධතියක් ඇති කර ඉලක්ක ලගාවීම් පිළිබඳ නිවැරදි වාර්තාකරණයක් කර නොතිබුණි. | 2018 මාර්තු 16 දිනැති අංක පීඑස්/එස්පී/එස්බී/3/201 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් සකස් කර දත්ත පද්ධතියක් පවත්වාගෙන යායුතු වේ. | සැලසුම් අංශය විසින් මේ සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |

**5. යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණන විමසුම් මගින් සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ චක්‍රලේඛ වලට අනුකූල නොවීම්, වාහන පාලනය, තොග පාලනය හා ලේඛන පොත්පත් පවත්වාගෙන යාම සහ ගිණුම්කරණය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධව අඩුපාඩු සහ පාලන පද්ධති දුර්වලතා පෙන්වාදී තිබුනද ඒවා නිවැරදි කරගැනිම විගණනයට වාර්තා නොවුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කල යුතුය. | අදහස් දක්වා නොමැත. |

**6. මානව සම්පත් කළමනාකරණය**

**6.1 අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ අනුමත මුළු කාර්ය මණ්ඩලය 447න් 348ක් සේවයේ යෙදී සිටි අතර තනතුරු 111ක ඌනතාවයක් හා තනතුරු 12 ක අතිරික්තයක් නිරීක්ෂණය විය. ඉන් පුරප්පාඩු 13 ක් ජොෂ්ඨ මට්ටමේ තනතුරු විය. විස්තර පහත දැක්වේ

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | ----------------- | ----------- | --------------- | ----------- |
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 65 | 52 | 13 |
| (ii) | තෘතියික මට්ටම | 09 | 07 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 237 | 167 | 70 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 136 | 122 | 14 |
| | එකතුව | 447 | 348 | 99 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ----------- | ------------------------------ |
| **(අ)** | සහකාර පුහුණු ද්‍රව්‍ය පාලක නිලධාරියකු නියෝජ්‍ය පුපුරණ ද්‍රව්‍ය පාලක තනතුරේ වැඩබැලීම සඳහා පත්කර තිබුණු අතර නියෝජ්‍ය පුපුරණ ද්‍රව්‍ය පාලක තනතුරු 01 ක හා අතිරේක නියෝජ්‍ය පුපුරණ ද්‍රව්‍ය පාලක තනතුරු 02 ක් මේ දක්වාම පුරප්පාඩුවී තිබුණි. | පුහුණු ද්‍රව්‍ය සම්බන්ධයෙන් සිවිල් ආරක්ෂක අංශය වෙත පැවැරී ඇති කාර්යබාරය ඉටුකලහැකි වන පරිදි අනුමත කාර්යමණ්ඩල පුරප්පාඩු සඳහා බඳවාගැනීම් සිදුකල යුතුය. | අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |
| (ආ) | විධිමත් ලෙස ස්ථාපිත නොකර ජාතික ආරක්ෂක අධ්‍යන ආයතනය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු සමග අධ්‍යක්ෂ තනතුරු 3 ක්, පර්යේෂණ විශ්ලේෂක තනතුරු 1 ක් හා පර්යේෂණ සහකාර තනතුරු 4 ක් සඳහා තාවකාලික පත්කිරීම් සිදුකර මාස 06 කට වරක් සේවය දීර්ඝ කරමින් වැටුප් ගෙවමින් පැවතුණි. | ලැබී ඇති අනුමැතීන් ප්‍රකාරව ස්ථිර කාර්යමණ්ඩල බඳවාගැනීම කල යුතුය. | අදහස් දක්වා නොමැත. |